**එක්සත් ජාතික පක්ෂය**
ஐக்கிய தேசியக் கட்சி
**United National Party**

# එක්සත් ජාතික පක්ෂය නිකුත් කළ නිවේදනය

එක්සත් ජාතික පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම Viii වැනි විධායක ජනාධිපති, එජාප නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ මල් පාර දේශපාලන කාර්යාලයේදී අද (11) පස්වරුවේදී පැවැත්විණි.

එජාප කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයින් බහුතරයකගේ සහභාගීත්වයෙන් පැවැති මේ රැස්වීමේදී වර්තමාන දේශපාලන තත්ත්වයට අදාළ එක්සත් ජාතික පක්ෂ ප්‍රතිචාරය පිළිබඳ අදහස් ප්‍රකාශ කරනු ලැබීය.

එක්සත් ජාතික පක්ෂ සංවිධානය යළි ගොඩනැංවීමට අදාළ වැඩපිළිවෙල සම්බන්ධයෙන් කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී වැදගත් අදහස් රැසක් සාකච්ඡා කිරීම විශේෂත්වයකි.

එසේම අනෙකුත් දේශපාලන පක්ෂ, බලවේග සහ සංවිධාන සමග ඉදිරි සම්බන්ධීකරණ කටයුතු කරන ආකාරය පිළිබඳව කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයින් දැනුවත් කිරීමට පියවර ගැනුණි.

තනි තනිව නොව සෑම බලවේගයක් සමගම එකට එකතු වී ඉදිරි දේශපාලන අභියෝගවලට මුහුණදිය යුතු ආකාරය සම්බන්ධයෙන් Viii වැනි විධායක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී අදහස් දක්වමින් පෙන්වා දුන්නේය.

පක්ෂයේ විනය නීති රීතීවලට පටහැනිව ක්‍රියා කළ පළාත් පාලන ආයතන නියෝජිතයින් සම්බන්ධයෙන් ගත් පියවර එක්සත් ජාතික පක්ෂ මහලේකම් නීතිඥ තලතා අතුකෝරළ මහත්මිය කෘත්‍යාධිකාරී මණ්ඩලය හමුවේ ප්‍රකාශයට පත් කළාය.

එක්සත් ජාතික පක්ෂ සංවිධාන යළි ගොඩනැගීම සහ අනෙකුත් දේශපාලන පක්ෂ, බලවේග, සංවිධාන සමග සම්බන්ධීකරණය පිළිබඳව දීර්ඝ වශයෙන් අදහස් හුවමාරු කරගනිමින් තීරණවලට එළැඹීම කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී විශේෂත්වයක් වූ බව එජාප සභාපති වජිර අබේවර්ධන මහතා ප්‍රකාශ කළේය.

**එක්සත් ජාතික පක්ෂය**
2026 ජූනි 11



**මධ්‍යම කාර්යාංශය** மத்திய பணியகம் **Central Bureau**
"සිරිකොත මන්දිරය", 400, කෝට්ටේ පාර, පිටකෝට්ටේ, ශ්‍රී ලංකාව.
"சிறிகொத இல்லம்", 400 கோட்டே றோட், பிட்டகோட்டே, இலங்கை.
"Sirikottha House", 400, Kotte Road, Pitakotte, Sri Lanka.
Tel: 0112865374 / 0112865375 Fax : 0112865380
E-mail : gnunp@sltnet.lk Web : www.unp.lk